අල්ලාහ් ගර්භාෂයට මලක්වරයකු පත් කළේය. ඔහු: “පරමාධිපතියාණනි! මෙය ශුක්රානුවකි. පරමාධිපතියාණනි! මෙය ලේ කැටියකි. පරමාධිපතියාණනි! මෙය මස් කැබැල්ලකි.” යැයි පවසයි. එහි මැවීම නිමා කිරීමට අල්ලාහ් අපේක්ෂා කළ විට, “පරමාධිපතියාණනි, පිරිමියෙකු ද එසේ නැතහොත් ගැහැණියකු ද? භාග්ය වන්තයකු ද එසේ නැතහොත් අභාග්යවන්තයෙකු ද? පෝෂණ සම්පත් කුමක් ද? ආයු කාලය කුමක් ද? එලෙස ඔහුගේ මවගේ කුස තුළ ලියනු ලැබේ.”

අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. "අල්ලාහ් ගර්භාෂයට මලක්වරයකු පත් කළේය. ඔහු: “පරමාධිපතියාණනි! මෙය ශුක්රානුවකි. පරමාධිපතියාණනි! මෙය ලේ කැටියකි. පරමාධිපතියාණනි! මෙය මස් කැබැල්ලකි.” යැයි පවසයි. එහි මැවීම නිමා කිරීමට අල්ලාහ් අපේක්ෂා කළ විට, “පරමාධිපතියාණනි, පිරිමියෙකු ද එසේ නැතහොත් ගැහැණියකු ද? භාග්ය වන්තයකු ද එසේ නැතහොත් අභාග්යවන්තයෙකු ද? පෝෂණ සම්පත් කුමක් ද? ආයු කාලය කුමක් ද? එලෙස ඔහුගේ මවගේ කුස තුළ ලියනු ලැබේ.” [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා මෙසේ ප්රකාශ කරයි: “නියත වශයෙන්ම උත්තරීතර අල්ලාහ් ගර්භාෂයට මලක්වරයෙකු පත් කළේය.” එනම්: අල්ලාහ් ගර්භාෂයේ කටයුතු ක්රියාත්මක කිරීම සඳහා මලක්වරුන් අතරින් එක් මලක්වරයකු නියම කර ඇත. එය ‘රහ්ම්’ යනු මව් කුස තුළ දරුවන් බිහිවන ස්ථානයයි. පසුව ඔහු: “පරමාධිපතියාණනි! මෙය ශුක්රාණුවකි” යැයි පවසයි. එනම්: පරමාධිපතියාණනි, මෙය ‘නුත්ෆා’ ශුක්ර බිඳුවකි යන්නයි. ශුක්රාණු යනු පිරිමියාගෙන් පිටවන ජල වස්තුවකි. ඉන් පසුව ඒ සමාන තවත් ප්රකාශයක් සිදු කළහ. “පරමාධිපතියාණනි! මෙය ලේ කැටියකි. එනම්: පරමාධිපතියාණනි! මෙය ගර්භාෂයේ එල්ලී ඇති ‘අලකා’ හෙවත් ලේ කැටියකි. ‘අලකා’ යනු: කැටිවුනු ලේ දල්ලකි. පසුව ඔහු: “පරමාධිපතියාණනි! මෙය මස් කැබැල්ලකි. එනම් පරමාධිපතියාණනි! මෙය ‘මුළ්ආ’ නොහොත් මස් කැබැල්ලකි. තවත් වාර්තාවක විස්තර කර ඇති පරිදි ඒ සෑම අදියරයකටම කාලය දින හතළිහක් බැගින් වේ. පසුව සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා මෙසේ පැවසීය. “එහි මැවීම නිමා කිරීමට අල්ලාහ් අපේක්ෂා කළ විට” එනම් මස් කැබැල්ලෙහි නිමාවයි. අවසන් අදියරය එයයි. ‘නිමා කිරීම’ යනුවෙන් අදහස් කරනුයේ එය මවා අවසන් කිරීමය. තවත් වාර්තාවක පැහැදිළි කර ඇති පරිදි දින එකසිය විස්සකට පසුව එහි ප්රාණය පිඹිනු ලැබීමෙනි. මලක්වරයා නැවතත් “පරමාධිපතියාණනි, පිරිමියෙකු ද ගැහැණියකු ද” එනම් පරමාධිපතියාණනි, පිරිමියෙක් ද මම ඔහුව සටහන් කර ගන්නම්. එසේ නැතහොත් ගැහැණියක් ද? “භාග්ය වන්තයකු ද අභාග්යවන්තයෙකු ද?” එනම් ඔහු අපා ගින්නේ වාසීන් අතරට පත් වන අභාග්යවන්තයෙක් ද මම ඔහුව සටහන් කර ගන්නම්. එසේ නැතහොත් ඔහු ස්වර්ගවාසීන් අතරට පත්වන භාග්යවන්තයෙක් ද? එලෙස එය ද මම සටහන් කර ගන්නම්. යනුවෙන් පවසයි. “පෝෂණ සම්පත් කුමක් ද?” අඩුවෙන් විය යුතුද වැඩියෙන් විය යුතු ද, එහි ප්රමාණය කුමක් ද? “ආයු කාලය කුමක් ද?” ඔහුගේ

http://sunnah.global/hadeeth/si/show/6328